3090

මගේ අංකය - 8/3/2
නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය
ගිරිතලේ ව්‍යාපාරය
ජයන්තිපුර
2019.11.20




## 2019/20 මහ කන්න රැස්වීම් වාර්තාව - ගිරිතලේ ව්‍යාපාරය

පොලොන්නරුව දිස්ත්‍රික් ලේකම් තුමන්ගේ ප්‍රධානත්වයෙන් 2019.11.11 වන දින ප.ව. 2.00 ට නේවාසික ව්‍යාපෘති කළමනාකරණ රැස්වීම් ශාලාවේදී 2019/20 මහ කන්න සඳහා කන්න රැස්වීම පවත්වන ලදි. පැමිණ සිටි සියලු දෙනා නේවාසික ව්‍යාපෘති කළමානාකාරතුමා විසින් පිළිගැනීමෙන් හා අරමුණ පැහැදිලි කිරීමෙන් අනතුරුව රැස්වීම මෙහෙයවීම සඳහා පොලොන්නරුව දිස්ත්‍රික් ලේකම්තුමන් වෙත මූලාසනය භාරදෙන ලදි.

සහභාගි වූවෝ :-
රාජ්‍ය නිළධාරීන් - 36 ගොවි සංවිධාන නිළධාරීන් - 49

සහභාගී වූ රාජ්‍ය නිලධාරීන්

| | |
|---|---|
| පණ්ඩුක එස්.පී. අබේවර්ධන | දිස්ත්‍රික් ලේකම්, පොළොන්නරුව |
| එස්.කේ.හේවාගම | වාරිමාර්ග අධ්‍යක්ෂ, පොළොන්නරුව |
| ඩබ්.ඒ.එස්.ප්‍රියන්ත | නේවාසික ව්‍යාපෘති කළමනාකාරු, ගිරිතලේ |
| අයි.ඩබ්.කේ. ඉඹුල්ගොඩ | කෘෂිකර්ම අධ්‍යක්ෂ, පොළොන්නරුව |
| ආර්.පී.උපාලි | නියෝජ්‍ය කෘෂි කර්ම අධ්‍යක්ෂ, අන්තර් පළාත් |
| එච්.එම්. කුලතුංග | සහකාර කොමසාරිස්, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව |
| ඩබ්.ටී. අජන්ත ප්‍රියදර්ශන | සහකාර අධ්‍යක්ෂ, කෘෂි රක්ෂණ මණ්ඩලය |
| ආර්.ඒ.සී.කේ. රණසිංහ | සහකාර අධ්‍යක්ෂ, ජාතික පොහොර ලේකම් කාර්යාලය |
| ඒ.එම්.ඒ.අයි.බී.අබේසිංහ | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු, මින්නේරිය |
| එම්.පි.ඒ.ජී.ප්‍රියදර්ශනි මැදඇල | ප්‍රාදේශීය නිළධාරී ගොවිජන සේවා මධ්‍යස්ථානය,ගිරිතලේ |
| එම්.ජී.ඒ.එස්. බණ්ඩාර | ප්‍රාදේශීය නිළධාරී ගොවිජන සේවා මධ්‍යස්ථානය,නවනගරය |
| අයි.අයි.පී.කේ. අමරසූරිය | ස්ථානභාර කෘෂිකර්ම උපදේශක, නවනගරය |
| ඩී.ජී. ස්වරනා කුමාරි | ස්ථානභාර කෘෂිකර්ම උපදේශක, ගිරිතලේ |
| පී.ජේ.ආර්.පී. ජයවික්‍රම | ආයතන සංවර්ධන නිළධාරී, ගිරිතලේ |
| වයි.එම්.ඒ.එස්. කරුණාරත්න | සංවර්ධන නිළධාරී, ගිරිතලේ |
| ටී.එම්.සී.කුලතුංග | සංවර්ධන නිළධාරී, ගිරිතලේ |
| ඩබ්.ඒ.ජී.ඩී.වීරසිංහ | සංවර්ධන නිළධාරී, ගිරිතලේ |
| එච්.සී.එස්. අමරසූරිය | ඉංජිනේරු සහකාර, මින්නේරිය |
| සී.එම්.ටී.ඩී.බී. වන්දෙස්කර | ඉංජිනේරු සහකාර, මින්නේරිය |
| එම්.ඩී.ජී.පී. වීරසිංහ | ඉංජිනේරු සහකාර, මින්නේරිය |
| ඩබ්.එම්.ඒ. වාමර | කෘෂිකර්ම උපදේශක, බීජ හා රෝපණ ද්‍රව්‍ය කාර්යාලය |
| ආර්.ඒ. නදීෂා සංජීවනී | කෘෂිකර්ම උපදේශක, නවනගරය |
| ඩබ්.පී.එස්. හිමාලි පෙරේරා | කෘෂිකර්ම උපදේශක, ගිරිතලේ |
| මල්ලිකා හේරත් | කෘ.ප.නි.ස, ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| ඩී.අයි.ටී.නිමල් අමරසිංහ | කෘ.ප.නි.ස, ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| අයි.වයි.ජී. රාජපක්ෂ | කෘ.ප.නි.ස, ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| ආර්.ජී.අයි. සිරියලතා | කෘ.ප.නි.ස, ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| එච්.එම්.එස්.නිලන්ති හිටිනායක | කෘ.ප.නි.ස, ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| ජේ.ඒ.රම්‍යලතා ජයසිංහ | කෘ.ප.නි.ස, ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| ඩබ්.ජී.එස්.එස්.කේ. නන්දසිරි | කෘ.ප.නි.ස, ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| ඩබ්.ඒ.එල්.ගයානි වික්‍රමආරච්චි | කෘ.ප.නි.ස, ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| ඩී.ආර්.ඉන්ද්‍රාවති මැණිකේ | කෘ.ප.නි.ස, ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| පී.ආර්.පී. පැලවත්ත | කෘ.ප.නි.ස, ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| එච්. මල්ලිකා හේරත් | කෘ.ප.නි.ස, ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| ජී. රංජිත් පෙරේරා | පොලිස් නිලධාරී, මින්නේරිය |
| ජී.ජේ.ටී. කුමාර | ප්‍රාදේශීය කළමනාකාරු, ලක් පොහොර සමාගම |

සහභාගි වූ ගොවි නියෝජිතයින්

| | |
|---|---|
| පී.ආර්.ජයරත්න | සභාපති, 48 බෙදුම් ඇලගොවි සංවිධානය |
| ජී.සී.කේ. හේරත් | සභාපති, ජනපදය බෙදුම් ඇල ගොවි සංවිධානය |
| එම්. පී. රූපසිංහ | සභාපති ,ජයන්තිපුර බෙදුම් ඇල ගොවි සංවිධානය |
| එන්.කේ.ඩී. ගාමිනි නානායක්කාර | සභාපති වන්දනපොකුණ බෙදුම් ඇලගොවි සංවිධානය |
| ඒ. අසීස් | සභාපති, පුරාණ මුස්ලිම්ගම බෙදුම්ඇල ගොවි සංවිධානය |

| | |
|---|---|
| ඩබ්.ඒ. පොඩි රාළහාමි | සභාපති, පැරකුම් බෙදුම් ඇල ගොවි සංවිධානය |
| එම්.ආර්. කුඩාබණ්ඩා | සභාපති, උණගලාවෙහෙර බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ඩී.එම්. පුංචිබංඩා | සභාපති, කඩවලවැව බෙදුම් ඇල ගොවි සංවිධානය |
| බී.එම්. රංජිත් බංඩාර | සභාපති, නාගපොකුණ බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ආර්.ඒ.රූපසිංහ | සභාපති, පුරාණ ගිරිතලේගම බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ඩබ්.කේ. ඉන්දික | සභාපති, බැදිවැව බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ආර්.ඒ. නිමල් රූපසිංහ | සභාපති, අග්බෝපුර බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ආර්.ඊ.එම්. අබේරත්න බංඩාර | සභාපති, මහසෙන්පුර බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ජී.එම්.එම්. සෝමරත්න මල්ලව | සභාපති, විජය බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ඩී.එම්. විජේරත්න | සභාපති, සමගි බෙදුම් ඇල ගොවි සංවිධානය |
| අයි.එම්.එස්. සිසිර කුමාර | ලේකම්, චන්දනපොකුණ බෙදුම් ඇල ගොවි සංවිධානය |
| එච්. එම්. විජේරත්න | ලේකම්, පැරකුම් බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ඒ.එම්. සෝමරත්න | ලේකම්, උණගලාවෙහෙර බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ඩබ්.එච්.එම්.එස්. විජේසුන්දර | ලේකම්, පුරාණ ගිරිතලේගම බෙදුම් ඇල ගොවි සංවිධානය |
| එච්.ඒ. සිරිල් කරුණාරත්න | ලේකම්, සමගි බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ඩී.ආර්. නිලන්ත දිසානායක | ලේකම්, 48 බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ආර්. ඒ. සිරිසේන | ලේකම්, මහසෙන් බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ආර්.එම්.ජී. රත්නායක | ලේකම්, විජය බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ජේ.එච්. බණ්ඩාරනායක | ලේකම්. කඩවලවැව බෙදුම් ඇල ගොවි සංවිධානය |
| යූ.කේ. කාවින්ද විජේරත්න | ලේකම්, පුරාණගම බෙදුම් ඇල ගොවි සංවිධානය |
| එච්.එම්. ජයලත් දිසානායක | ලේකම්, ජයන්තිපුර බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ජී.එම්. මුදියන්සේ | ලේකම්, අග්බෝපුර බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ඊ.ඩී. නිලන්ති එදිරිසිංහ | භාණ්ඩාගාරික, බැදිවැව බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ඩී.ඩබ්. හෙට්ටිවත්ත | භාණ්ඩාගාරික, පුරාණ ගිරිතලේගම බෙදුම් ඇල ගොවිසංවිධානය |
| වයි. ජී. චන්ද්‍රරත්න | භාණ්ඩාගාරික, පැරකුම් බෙදුම් ඇල ගොවි සංවිධානය |
| එල්. ශ්‍රියානි ධම්මිකා | භාණ්ඩාගාරික, පුරාණගම බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ආර්.එම්. මානෙල් පෙරේරා | භාණ්ඩාගාරික, මහසෙන් බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ආර්.එම්. ජයවර්ධන බණ්ඩා | භාණ්ඩාගාරික, අග්බෝපුර බෙදුම් ඇල ගොවි සංවිධානය |
| එච්.ඒ.ඩබ්. ලාල් හෙට්ටිආරච්චි | භාණ්ඩාගාරික. උණගලාවෙහෙර බෙදුම් ඇල ගොවි සංවිධානය |
| සාමිදී | භාණ්ඩාගාරික, මුස්ලිම්ගම බෙදුම් ඇල ගොවි සංවිධානය |
| එච්.ඒ.පොඩිබංඩාර | භාණ්ඩාගාරික, නාගපොකුණ බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ඩී.ඩී. වීරවංශ | උපදේශක, ඒකාබද්ධ ගොවි සංවිධානය |
| එච්.එම්. රණතුංග බණ්ඩා | හිටපු සභාපති, ජනපදය බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ඩී.ඒම්.ආරියසේන | ජලපාලක, සමගි බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ආර්.එම්. සේනාරත්න | ජලපාලක, අගබෝපුර බෙදුම් ඇල ගොවි සංවිධානය |
| එම්. විජේරත්න | ජලපාලක, විජය බෙදුම් ඇල ගොවි සංවිධානය |
| කේ.ඩී. සුනිල් | ජලපාලක, බැදිවැව බෙදුම් ඇල ගොවි සංවිධානය |
| යූ.ජී. නිමල් ශාන්ත ජයකොඩි | ජලපාලක, චන්දනපොකුණ බෙදුම් ඇල ගොවි සංවිධානය |
| එච්.එම්.ටී. බණ්ඩාර | නියෝජිත, සමගි බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ඩී.ඒ. ප්‍රේමරත්න | නියෝජිත, බැදිවැව බෙදුම් ඇල ගොවි සංවිධානය |
| බී.එල්. සෝමපාල | නියෝජිත, මහසෙන් බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ඩබ්.එම්. ගුණරත්න | නියෝජිත, මහසෙන් බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ඩී.එම්.එස්. දසනායක | නියෝජිත, මහසෙන් බෙදුම් ඇල ගොවි සංවිධානය |
| යූ.ඩී. ආරියරත්න | නියෝජිත, මහසෙන් බෙදුම් ඇල ගොවි සංවිධානය |

<u>සහභාගි නොවූ ගොවි නියෝජිතයින්</u>

| | |
|---|---|
| ඩී.එච්.එම්. සිසිර කුමාර | ලේකම්, නාගපොකුණ බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ඒ.ජී.බණ්ඩාර මැණිකේ | ලේකම්, බැදිවැව බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ඒ.ඒ.ඉමාදින් | ලේකම්, මුස්ලිම්ගම බෙදුම් ඇල ගොවි සංවිධානය |
| අයි.පී. ජයරත්න | භාණ්ඩාගාරික, 48 බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ඩබ්.එම්. චන්දන රංගජීව | භාණ්ඩාගාරික, චන්දනපොකුණ බෙදුම් ඇල ගොවි සංවිධානය |
| යූ.එච්. මුදියන්සේ | භාණ්ඩාගාරික, විජය බෙදුම් ඇල ගොවි සංවිධානය |
| ඩබ්.ඒ.ඩී. ශාන්ත ගුණසේකර | භාණ්ඩාගාරික, කඩවලවැව බෙදුම් ඇල ගොවි සංවිධාන |
| ආර්. හින්නි මහත්තයා | භාණ්ඩාගාරික, සමගි බෙදුම් ඇල ගොවි සංවිධානය |
| අයි.ඩී. සුනිල් කරුණාරත්න | භාණ්ඩාගාරික, ජයන්තිපුර බෙදුම් ඇල ගොවි සංවිධානය |

දිස්ත්‍රික් ලේකම් - පොළොන්නරුව

- ඔක්තෝම්බර් මාසයේ යම් වර්ෂාපතනයක් ඉහළ ජලාශවලට ලැබුනත් එම වර්ෂාපතනය ප්‍රමාණවත් නොවීම හා මේ වනවිටත් වර්ෂාව නොලැබීම හේතුවෙන් මෙවර 2019/20 මහ කන්නය ආරම්භ වීම ප්‍රමාද වන බව
- කවුඩුල්ල හා කන්තලේ ව්‍යාපාර වලට අවශ්‍ය ජලය ගෙනයාම සඳහා පළමුව මින්නේරි ජලාශය පිරවීමට සිදුවන බව
- එහෙත් කවුඩුල්ල ව්‍යාපාරය සඳහා ප්‍රමාණවත් තරම් ජලය මදි වන බවත් කවුඩුල්ල ව්‍යාපාරයට ජලය ගෙන යාමට සිදුවන බැවින් මෙවර කන්නය පහු කිරීමට සිදුවන බව
- කවුඩුල්ල, කන්තලේ ජලාශවල අර්බුදකාරී තත්වය මගහරවමින් මින්නේරිය හා ගිරිතලේ ව්‍යාපාරය තීන්දු තීරණ ගතයුතු බව
- මහවැලි ජල පාලන කමිටුවේ තීන්දු වූ ලෙස 2019.11.20 වන දින ජලය නිකුත් කිරීමට නොහැකි වන බව
- මේ සියලු කරුණු සලකා බලා ගිරිතලේ ව්‍යාපාරයට 2019.11.30 වන දින විට ජලය නිකුත් කිරීමට හැකි වන බව

01. 2019/20 මහ කන්නය සඳහා ජල නිර්දේශ ඉදිරිපත් කිරීම

දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ - පොළොන්නරුව

- 2019.11.11 වන දින වන විට ජලාශයේ ධාරිතාව අක්කර අඩි 9500 ක් පවතින බවත්
- මේවන විට මොරගහකන්ද ජලාශය අක්.අඩි ලක්ෂ දෙකක පමණ ජල ධාරිතාවක් පවතින බව
- ගිරිතලේ ව්‍යාපාරය කන්නයක් සාර්ථක කර ගැනීම සඳහා ගිරිතලේ ජලාශය දෙවරක් පිරවිය යුතු බව
- මහවැලි ජල පාලන කමිටුව මගින් 2019.11.20 දින ගිරිතලේ ව්‍යාපාරයට ජලය නිකුත් කිරීමට තීරණය කළද ප්‍රමාණවත් තරම් ජලය නොලැබීම හේතුවෙන් එම තීරණය වෙනස් කිරීමට සිදුවන බව
- ඒ අනුව ගිරිතලේ, කඩුල්ල, මින්නේරිය යන ව්‍යාපාර තුන සඳහාම 2019.11.30 වන දින ජලය නිකුත් කිරීමට යෝජනා කරන බවත්
- කන්නය සාර්ථක කර ගැනීමට හැකිවන පරිදි සුහදායක තීන්දු තීරණ වලට එළඹීම සුදුසු වන බවත්

02. කෘෂිකර්ම සංවර්ධනය

නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ - පොළොන්නරුව( අන්තර් පලාත්)

- මෙවර 2019/20 මහ කන්නය ගැටළුකාරී තත්වයක ආරම්භ කිරීමට සිදුවන බවත්
- ජලාශ පිරී නොතිබීම නිසා අපට අවැසි ලෙස තීරණ ගැනීමට නොහැකි වන බවත්
- මාස 3, 3 2/1 වී වගාව සහ අතිරේක භොග වගා කිරීම සුදුසු බවත්
- වී වගාවේ පීදුම් කාලය හොඳින් අවුව ඇති කාලයක විය යුතු බව
- ඒ අනුව සිංහල අලුත් අවුරුද්දට පෙර අස්වැන්න නෙලා අවසන් කිරීමට හැකි වන පරිදි අවම වශයෙන් අප්‍රේල් 10 වන විටවත් අස්වැන්න නෙලා අවසන් කර ගැනීමට හැකිවන පරිදි කන්න තීන්දු තීරණ ගැනීම සුදුසු වන බව

03. යෙදවුම් හා සැපයුම් සම්පාදනය

ගොවිජන සේවා සහකාර කොමසාරිස්

- මෙම කන්නයේත් පෙර කන්නවල පොහොර බෙදා දුන් ආකාරයෙන්ම පොහොර බෙදාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇති බවත්
- ගිරිතලේ ව්‍යාපාරයට අදාල ගොවි සංවිධාන 5 ක් පමණ පොහොර නිකුත් කිරීම ගොවිජන සේවා මධ්‍යස්ථානයේ දීම සිදු කිරීමට ඉල්ලීම ඉටු කළ නොහැකි බව
- ගොවිජන සේවා මධ්‍යස්ථානයේ එක් ලිපිකරුවකු පමණක් සිටින පොහොර බෙදා දීමේදී යම් ගැටළුකාරී තත්ත්වයකට මුහුණ පෑමට සිදුවන බවත්
- එම නිසා එම ගොවි සංවිධාන 5 ත් ගොවි සංවිධානය හරහා පොහොර බෙදාදීමේ වැඩසටහනක් සංවිධානය කර ක්‍රියාත්මක කිරීමට ඉල්ලීම් කරන බවත්
- ගොවි ණය වැඩසටහන ක්‍රියාත්මක කරන බව

කෘෂිකර්ම උපදේශක - බීජ හා රෝපණ කාර්යාලය

- මෙවර 2019/20 මහ කන්නය සඳහා ගොවීන්ට අවශ්‍ය පරිදි බීජ ලබා දිය හැකි බවත් මේ වනවිට බීජ සැපයීම ආම්භකර ඇති බවත්
- බිත්තර වී නිෂ්පාදනය කරන ගොවි මහතුන්ට 300, 307 352, 310, 450, 457 යන වී ප්‍රභේද වලින් සහතික පංතියේ බීජ ලබාගත හැකි බවත්

සහකාර අධ්‍යක්ෂ - පොහොර ලේකම් කාර්යාලය

- 2019/20 මහ කන්නය සඳහා අවශ්‍ය පරිදි පොහොර ඇති බව
- මෙම කන්නයේ දී වෙන කන්න මෙන් පොහොර සඳහා ගැටළු නොපවතින බව
- පොහොර යෙදීමේදී TSP නියමිත වේලාවටම යෙදීම කළ යුතු බව
- ගොවි සංවිධානයට රැගෙන ගොස් ගොවි සංවිධානය හරහා පොහොර බෙදීම සුදුසු බව
- සී සෑමේදී කොකු නගුල යෙදීම සුදුසු බවත් එවිට ගස් වර්ධනය හොඳින් සිදුවන බව

06. ඇලවේලි/නිර්මිත හෝ වාරි පද්ධතියේ උපාංග වලට හානි කරන පුද්ගලයින් නීතිය ඉදිරියට පැමිණවීමට වාරිමාර්ග ආඥා පනතේ 23 වන වන්තිය ප්‍රකාරව ගොවි සංවිධාන වෙත බලයපවරා ඇති අතර එකී පනතේ viii කොටසේ 93 වනවගන්තිය අනුව වැරදිකරුවන්ට මහේස්ත්‍රාත් අධිකරණයකදී කරනු ලබන නඩු විභායකින් අනතුරුව දඩුවමට ලක්වනු ඇත.
07. වාරි ජලයට අපද්‍රව්‍ය / විෂ එක් කරන තැනැත්තන් සම්බන්ධයෙන් 2000 අංක 46 දරණ ගොවි ජන සංවර්ධන පනතේ 84(1) වගන්තිය ප්‍රකාරව වරදකරුවන් දඩුවමට ලක්වනු ඇත.වූදිතයන් නීතිය හමුවට පැමිණවීමට ගොවි සංවිධාන නියෝජිතයන් හට බලය පවරණු ලැබේ.
08. කෘෂි ඇල සහ මාර්ග රක්ෂිත වගා කිරීම සපුරා තහනම්.
09. අනවසරයෙන් බට දමා වාරි ජලය ලබා ගැනීම සපුරා තහනම්.
10. නඩත්තු අරමුදල් නොගෙවන නිසි පරිදි ඇල වේලි ශුද්ධ නොකරන සාමාජිකත්වය ලබා නොමැති ගොවීන්ගේ පොහොර සහනාධාරය නිර්දේශ නොකිරීමට ගොවි සංවිධානයට හැකි වේ.
11. මෙම කන්න රැස්වීමේ තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම ගොවි සංවිධානය වෙත පවරා ඇති අතර ගොවි සංවිධානය වෙනුවෙන් ක්‍රියාකරන ගොවි නියෝජිතයන් හෝ ජල පාලකවරු රාජකාරියෙහි නියැලෙන විට බාධා කිරීමක්, ඉඩ නොදීමක්, පරිබව කිරීමක් හෝ හිංසා කිරීමක් සිදු කිරීම අධිකරණයේ දී රාජකාරියට බාධා කිරීමේ වරදට වරදකරු වේ. ඒ සඳහා වාරිමාර්ග ආඥා පනතේ 95 වන වගන්තිය හා 2000 අංක 46 දරණ ගොවි ජන සංවර්ධන පනතේ 72 වන වගන්තිය ප්‍රකාරව නීතිමය රැකවරණය සලසා ඇත.
12. අමතරව ජල මුරයක් ලබා දීම සඳහා ජලය ලබා ගන්නා ගොවි මහතුන්ගෙන් අක්කර 01 සඳහා රු. 500/-ක මුදලක් අයකරන බවත්, ඒවන විට වගාවේ 25% පමණ තිබෙන බවට ගොවි සංවිධානය විසින් ලිඛිතව තහවුරු කිරීම
13. අනපේක්ෂිත ලෙස අයහපත් කාළගුණික තත්වයක් හේ කිසියම් පාලනය කළ නොහැකි බාහිර උපද්‍රවයන් ඇති වූ විට මෙම තීන්දු තීරණ සංශෝධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම ව්‍යාපාර කළමනාකරණ කමිටුව සතු විය යුතු බව.
14. මෙම කන්න තීරණ සම්බන්ධයෙන් යම් සඳහනක් පිළිබඳව අර්ථ නිරූපණය කිරීමේ බලය පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් සතුය.

- පෙර කන්න රැස්වීමේ තීරණ යෝජනා කිරීම - ගරු භාණ්ඩාගාරික, කඩවලවැව බෙදුම් ඇල ගොවි සංවිධානය
- පෙර කන්න රැස්වීමේ තීරණ ස්ථිර කිරීම -ගරු සභාපති, අග්බෝපුර බෙදුම් ඇල ගොවි සංවිධානය

<u>ගොවි නායක මහත්ම/මහත්මීන්ගේ අදහස්</u>

<u>ගරු සභාපති - නාගපොකුණ බෙදුම් ඇල ගොවි සංවිධානය</u>

- 2009.11.30 වන දින ජලය නිකුත් කරන තුරු දැනට ගිරිතලේ ජලාශයේ පවතින ජලය 2019.11.15 වන දිනවත් නිකුත් කිරීම සුදුසු වන බව

<u>ගරු සභාපති - චන්දනපොකුණ බෙදුම් ඇල ගොවි සංවිධානය</u>

- මීට පෙර කන්න දෙක තුනකදීම මීට වඩා අඩු ජල ප්‍රමාණයකින් පවා කන්නය ආරම්භ කළ බවත්
- යම් අවධානමක් දැරීමට සුදානම් බවත් ඒ සඳහා විශාල අත්දැකීම් සමූහයක් ඇති බවත්
- දැනට තියෙන ජල ප්‍රමාණය 2019.11.15 දින ලබාදෙන්නේ සාර්ථක කන්නයක් ආරම්භ කළ හැකි බවත් අඩුම තරමින් 2019.11.20 දින වත් ජලය නිකුත් කර දෙන ලෙස ඉල්ලීම් කරන බව

<u>ගරු ලේකම් - සමගි බෙදුම් ඇල ගොවි සංවිධානය</u>

- 2019.11.30 ජලය නිකුත් කරන තුරු දැනට ගිරිතලේ ජලාශයේ ඇති ජල ප්‍රමාණය වගා කටයුතු ආරම්භ කිරීම සඳහා ප්‍රමාණවත් වන්නේද යන්න පිළිබඳ පළමුව සලකා බැලිය යුතු බවත්
- මොරගහකන්ද ජලාශයේ රදවාගෙන සිටින ජලය හරිනම් තිබිය යුත්තේ මෙවන විට අප ජලාශ වල බවත්
- නොවැම්බර් මස 15 දිනෙන් පසු වගාව පිහිටුවීමෙන් සාර්ථක අස්වැන්නක් ලබා ගත නොහැකි බවත්
- මොන ගැටළුකාරී තත්වයක හිද හෝ 2019.11.15 වන ජලය නිකුත් කරන ලෙස ඉල්ලීම් කරන බව

<u>ගරු ලේකම් - අග්බෝපුර බෙදුම් ඇල ගොවි සංවිධානය</u>

- 2019.11.15 වන දින ජලය නිකුත් කිරීම සුදුසු බව

හිටපු සභාපති - ඒකාබද්ධ ව්‍යාපාර ගොවි සංවිධානය - ඩී.ඩී. වීරවංශ මහතා

- තම ව්‍යාපාරයේ ගොවි මහතුන්ට පෙර කන්නවල ලබාඇති මනා අත්දැකීම් සමුදායක් පවතින බවත්
- නියමිත දිනට වගාව ස්ථාපන කිරීම සඳහා කන්න කීපයක දැරූ උත්සාහය මෙවර ජලය නිකුත් කිරීමට ප්‍රමාද වීම නිසා යලි අසාර්ථක වන බවත්
- නියමිත වෙලාවට කන්නය ආරම්භ කිරීම තුලින් යන්ත්‍ර සූත්‍ර ගැටළුව, කම්කරු ගැටළුව, වී වෙලදපල ආදී ගැටළු කීපයකට සාර්ථක විසදුම් ලැබෙන බව
- මෙම කන්නය මාස් කන්නයක් බැවින් වර්ෂාව බලාපොරොත්තු විය හැකි බවත් උපරිමයෙන් ජලය භාවිත කර කන්නය නිම කිරීමට උත්සාහ දරන බව
- මෙම කන්නය පහුවීම තුල ඉදිරි යල් කන්නයටත් අවධානමක් පවතින බැවින් 2019.11.15 වන දින ජලය නිකුත් කරන ලෙස ඉල්ලීම් කරන බව

ගරු සභාපති - ජනපදය බෙදුම් ඇල ගොවි සංවිධානය

- මේ වනවිට ඇලවල් සියල්ල සුද්ද කර අවසන් බවත් 2019.11.20 ජලය නිකුත් කිරීම සුදුසු බව

**දිස්ත්‍රික් ලේකම් - පොළොන්නරුව**

- 2019 යල් කන්නයේ ගිරිතලේ ව්‍යාපාරයේ ජල කාර්ය 6.19 ක ඉතා ඉහළ අගයක් ගත් බවත්
- වෙන කන්න වල ගිරිතලේ ජලාශයට එක දිගට ජලය ආ බවත්, මෙවර කවුඩුල්ලට ජලය ලබා දීම සඳහා ගිරිතලේ ජලාශයට ජලය ලබාදීම නතර කරන බවත්
- එසේ නැති වුවහොත් කවුඩුල්ල ව්‍යාපාරයේ ඉහල ඇල වගා කටයුතු කරන ගොවීන් මෙවර කන්නය අතහැරීමට සිදුවන බව
- 2019.11.15 වන දින ජලය නිකුත් කර ජලය මදි වුවහොත් වගාව විනාශවන බවත් එම වගකීම තමා භාර නොගන්නා බවත්
- වර්ෂාව නොලැබුනොත් මේ අවධානම දරන්නේ කවුද යන්නත් ඒ අවධානම තමා නොදරන බවත් 2019.11.30 වන තුරු ජලය ගිරිතලේ වැවට මුදා හැරිය නොහැකි බව
- අමතර ජල මුර නිකුත් කිරීමට ද සිදුවන බවත්
- ජලය නිකුත් කළ හැකි ආසන්නම දිනය 2019.11.25 වන බවත්
- මහවැලි ජල පාලන කමිටුවේ තීරණ සමග එවිට ප්‍රමාද වන්නේ දින 5 ක් පමණක් බවත්
- මෙම කරුණු කාරුණිකව තේරුම්ගන්නා ලෙසත්

**ගරු ලේකම් - සමගි බෙදුම් ඇල ගොවි සංවිධානය**

- ගිරිතලේ ව්‍යාපාරය තුල ජල කාර්ය නිර්ණය කිරීමේ දී අසල්වාසී සුළු වාරිමාර්ග ව්‍යාපාරවල පවතින දත්තයන් උපයෝගී කරගැනීමෙන් වලකින ලෙසත් එසේ කල විට සමස්ථ ගිරිතලේ ව්‍යාපාරයට අසාධාරණයක් සිදුවන බවත්

**ගරු භාණ්ඩාගාරික - පුරාණ ගිරිතලේගම බෙදුම් ඇල ගොවි සංවිධානය**

- නොවැම්බර් මාසයේ දින 15 ක් එකදිගට පායන බවත් පසුව වර්ෂාව බලාපොරොත්තු විය හැකි බවත්
- පරිසර කෙරෙහි අපි තබා ඇති විශ්වාසයට මෙතරම් එරෙහි නොවිය යුතු බව
- වර්ෂාව ලැබුනොත් 2019.11.20 දින ජලය නිකුත් කිරීම සුදුසු බවත් එසේ නැතිනම් 2019.11.25 දින ජලය නිකුත් කිරීම සුදුසු බවත්

ගරු සභාපති - කඩවලවැව බෙදුම් ඇල ගොවි සංවිධානය

- පළමුවෙන්ම ගිරිතලේ ජලාශය පුරවා කවුඩුල්ලට ජලය ලබා දෙන්නේ නම් එම ජලයෙන් ගිරිතලේ ව්‍යාපාරයේ කන්න ආරම්භ කළ හැකි බවත්
- මේ වනවිට අනුරාධපුරේ ජලාශ පිරී වාන් දමා අපතේ යන බවත්

වාරිමාර්ග ඉංජිනේරු - මින්නේරිය

- 2019.11.30 ජලාශයට ජලය නිකුත් කරන තුරු 2019.11.20 දින සිට දින 10 ක් ජලය ලබා දීමට ජලය ප්‍රමාණවත් නොවන බවත්
- එවිට කියුසෙක් 160 ක පීඩනය මත දීමේදී වන්දනපොකුණට ජලය අඩු වන බව

ගරු සභාපති - පැරකුම් බෙදුම් ඇල ගොවි සංවිධානය

- ඉදිරියේ වර්ෂාව ලැබුනොත් කවුඩුල්ල ජලාශය ඉක්මනින් ම පිරෙන බවත් එහෙත් ගිරිතලේ ජලාශය එසේ ඉක්මනින් පිරෙන්නෙ නැති බවත්
- ඒ නිසා ගිරිතලේ ව්‍යාපාරයට ඉක්මනින් ජලය නිකුත් කර දෙන ලෙසත්

දිස්ත්‍රික් ලේකම් - පොලොන්නරුව

- 2019.11.30 දින වනතුරු ගිරිතලේ ජලාශයට ජලය නිකුත් කර නොහැකි බවත් 2019.11.25 දින ජලය නිකුත් කිරීම සඳහා ඔබ අකමැති වන්නේ නම් කන්න රැස්වීම කල් දමන බවත්

නේවාසික ව්‍යාපාර කළමානකරු - ගිරිතලේ

- ගිය කන්නයේ කන්තලේ ව්‍යාපාරයේ කුඹුරු යම් ප්‍රමාණයක් විනාශ වූ බවත්
- යල කන්නය කවුඩුල්ල හා කන්තලේ ව්‍යාපාරවලට ජලය ලබා දීම විශ්වාස කළ නොහැකි බවත්
- මේ පිළිබද නැවත නැවත කතා කිරීම තේරුමක් නොමැති බවත් මේ සියල්ල සලකා බලා සුදුසු තීරණයක් ගත යුතු බවත්
- ගිරිතලේ ව්‍යාපාරයේ ගොවි මහතුන් කැප කිරීම් කිරීමට කැමති පිරිසක් බවත්
- ඒ නිසා දිස්ත්‍රික් ලේකම්තුමා අපහසුතාවයට පත් නොකර අවශ්‍ය සුදුසු තීරණය ලබා ගැනීම යෝග්‍ය වන බවත්

ගරු සභාපති - නාගපොකුණ බෙදුම් ඇල ගොවි සංවිධානය

- දිගින් දිගටම මේ පිළිබද සාකච්ඡා කිරීම තේරුමක් නොමැති බවත්
- හොඳ වර්ෂාවක් ලැබුනහොත් 2019.11.20 ජලය ලබා දීමට අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙසත් එසේ නොමැති වුවහොත් 2019.11.25 දින ජලය නිකුත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලීමක් සිදුකරන බව

**2019/20 මහ කන්නයේ වගා කන්න තීන්දු තීරණ ඉදිරිපත් කිරීම**
**නේවාසික ව්‍යාපෘති කළමනාකරු - ගිරිතලේ**

1994 අංක 13 දරණ වාරිමාර්ග පනතින් සංශෝධිත 1968 අංක 48 දරණ වාරිමාර්ග ආඥා පනතේ විධිවිධාන අනුව 2019.11.11 වන දින ගිරිතලේ නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාල රැස්වීම් ශාලාවේ පැවති ගිරිතලේ මහා වාරිමාර්ග බල ප්‍රදේශයේ 2019/20 මහ කන්නයේ කන්න වගා රැස්වීමේදී පහත තීරණ වලට එළඹෙන ලදි.

| | වගා කරන බෝග වර්ගය | වී මාස 3,31/2, හිහ අතිරේක බෝග |
|---|---|---|
| | වගා කරන බිම් ප්‍රමාණය (රක්ෂිත හා ගොඩ ඉඩම් හැර) | හෙක්ටයාර් 2617 |
| 01. | ගොවින් විසින් ඇලවල් ශුද්ධ කිරීම කටයුතු අවසන් කළ යුතු දිනය | 2019.11.20 ට පෙර |
| 02. | ගොවි සංවිධාන විසින් ඇලවල්ශුද්ධ කිරීම හා නඩත්තු කටයුතු අවසන් කළ යුතු දිනය | 2019.11.24 ට පෙර |
| 03. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව ප්‍රධාන ඇල නඩත්තු වැඩ අවසන් කළ යුතු දිනය | 2019.11.24 ට පෙර |
| 04. | පළමු ජල මුරය නිකුත් කරන දිනය | 2019.11.25 |
| 05. | වගාව පිහිටවා අවසන් කළ යුතු දිනය | 2019.12.15 |
| 06. | මුර ජලය ආරම්භ කරන දිනය | 2019.12.16 |
| 07. | ට්‍රැක්ටර් හා ගවයන් යායෙන් ඉවත් කළ යුතු දිනය | 2019.12.15 |
| 08. | වගා රක්ෂණය අවසන් කළ යුතු දිනය | 2019.12.15 |
| 09. | දෙවන වර බෙදුම් ඇල, කෙත් ඇල, අපවහන ඇල ශුද්ධ කර අවසන් කල යුතු දිනය | 2020.01.31 ට පෙර |
| 10. | වගා හානි දැනුම් දිය යුතු අවසන් දිනය | 2020.04.02 |
| 11. | අවසන් වරට මුර ජලය නිකුත් කරන දිනය | 2020.03.16 |
| 12. | අස්වනු නෙලා අවසන් කළ යුතු දිනය | 2020.04.17 |
| 13. | පොහොර බෙදා අවසන් කළ යුතු දිනය | 2020.01.25 දින දක්වා |

1968 අංක 48 වාරිමාර්ග පනතේ 11 වන වගන්තියේ 1 හා 2 උප වගන්ති අනුව කන්නයට අදාළව සකස් කර ගන්නා රීති

01. වාරි ජලය ලබාගෙන දුම්කොළ වගා කිරීම සපුරා තහනම්.
02. ගොවි සංවිධාන නඩත්තු අරමුදල සඳහා වගා කරනු ලබන සෑම අක්කර 1 ක් සඳහාම රු. 200.00 ක මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතුය. එම මුදල ගොවි සංවිධානයේ නඩත්තු හා මෙහෙයුම් අරමුදලට බැර කළ යුතුය.
03. නියමිත දිනට බෙදුම් ඇල සහ කෙත් ඇල ශුද්ද නොකරන ගොවින්ගෙන් එම ඇල වෙලි ශුද්ධ කිරීම සඳහා බඹයකට රු. 250.00 ක මුදලක් අය කර ගැනීමට ගොවි සංවිධානයට අවසර දෙනු ලැබේ.
04. කන්නය තුළ දෙවතාවක් බෙදුම් ඇල හා කෙත් ඇල හා අපවහන ඇලවෙලි ශුද්ධ කිරීම අනිවාර්ය වේ.( කන්නය ආරම්භයේ සහ වගාව පිහිටුවා දින 45 න් පසු)
05. ගවයන් සහ ට්‍රැක්ටර් වාරිමාර්ග ඇලට ඇතුළු කිරීම සපුරා තහනම් වන අතර එසේ කළහොත් හානි වන ඇල වල් සහ නිර්මිත සඳහා වාරිමාර්ග ඉංජිනේරුගේ තක්සේරු මුදල ගොවි සංවිධානය විසින් අය කරනු ලැබේ.
06. ඇලවෙලි/නිර්මිත හෝ වාරි පද්ධතියේ උපාංග වලට හානි කරන පුද්ගලයින් නීතිය ඉදිරියට පැමිණවීමට වාරිමාර්ග ආඥා පනතේ 23 වන වන්තිය ප්‍රකාරව ගොවි සංවිධාන වෙත බලයපවරා ඇති අතර එකී පනතේ viii කොටසේ 93 වනවගන්තිය අනුව වැරදිකරුවන්ට මහේස්ත්‍රාත් අධිකරණයකදී කරනු ලබන නඩු විභායකින් අනතුරුව දඬුවමට ලක්වනු ඇත.
07. වාරි ජලයට අපද්‍රව්‍ය / විෂ එක් කරන තැනැත්තන් සම්බන්ධයෙන් 2000 අංක 46 දරණ ගොවි ජන සංවර්ධන පනතේ 84(1) වගන්තිය ප්‍රකාරව වරදකරුවන් දඬුවමට ලක්වනු ඇත. වූදිතයන් නීතිය හමුවට පැමිණවීමට ගොවි සංවිධාන නියෝජිතයන් හට බලය පවරණු ලැබේ.
08. කෘෂි ඇල සහ මාර්ග රක්ෂිත වගා කිරීම සපුරා තහනම්.
09. අනවසරයෙන් බට දමා වාරි ජලය ලබා ගැනීම සපුරා තහනම්.
10. නඩත්තු අරමුදල් නොගෙවන නිසි පරිදි ඇල වෙලි ශුද්ධ නොකරන සාමාජිකත්වය ලබා නොමැති ගොවීන්ගේ පොහොර සහනාධාරය නිර්දේශ නොකිරීමට ගොවි සංවිධානයට හැකි වේ.
11. මෙම කන්න රැස්වීමේ තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම ගොවි සංවිධානය වෙත පවරා ඇති අතර ගොවි සංවිධානය වෙනුවෙන් ක්‍රියාකරන ගොවි නියෝජිතයන් හෝ ජල පාලකවරු රාජකාරියෙහි නියැලෙන විට බාධා කිරීමක්, ඉඩ නොදීමක්, පරිබව කිරීමක් හෝ හිංසා කිරීමක් සිදු කිරීම අධිකරණයේ දී රාජකාරියට බාධා කිරීමේ වරදට වරදකරු වේ. ඒ සඳහා වාරිමාර්ග ආඥා පනතේ 95 වන වගන්තිය හා 2000 අංක 46 දරණ ගොවි ජන සංවර්ධන පනතේ 72 වන වගන්තිය ප්‍රකාරව නීතිමය රැකවරණය සලසා ඇත.
12. අමතරව ජල මුරයක් ලබා දීම සඳහා ජලය ලබා ගන්නා ගොවි මහතුන්ගෙන් අක්කර 01 සඳහා රු. 500/-ක මුදලක් අයකරන බවත්, ඒවන විට වගාවේ 25% පමණ තිබෙන බවට ගොවි සංවිධානය විසින් ලිඛිතව තහවුරු කිරීම
13. වාරිමාර්ග පද්ධතිය සුද්ද කිරීම සඳහා වල්නාශක යෙදීම සපුරා තහනම් වේ.
14. අනපේක්ෂිත ලෙස අයහපත් කාළගුණික තත්වයක් හේ කිසියම් පාලනය කළ නොහැකි බාහිර උපද්‍රවයන් ඇති වූ - විට මෙම තීන්දු තීරණ සංශෝධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම ව්‍යාපාර කළමනාකරණ කමිටුව සතු විය යුතු බව.
15. මෙම කන්න තීරණ සම්බන්ධයෙන් යම් සඳහනක් පිළිබඳව අර්ථ නිරූපණය කිරීමේ බලය පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් සතුය.

- කන්න රැස්වීමේ තීරණ යෝජනා කිරීම - ගරු සභාපති, නාගපොකුණ බෙදුම් ඇල ගොවි සංවිධානය
- කන්න රැස්වීමේ තීරණ ස්ථිර කිරීම -ගරු සභාපති, 48 බෙදුම් ඇල ගොවි සංවිධානය

| ඉදිරිපත් කළ අය | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| ගරු ලේකම් - සමගි බෙදුම් ඇල ගොවි සංවිධානය | දැනට තහනම් කර ඇති ග්ලයිපොසෙට් වල් නාශකය වාරිමාර්ග ඇල සුද්ද කිරීම සඳහා ගොවින් යොදන බැවින් වාරිමාර්ග ඇල පද්ධතිය විනාශ වී යන බව | කන්න තීරණ රීති වලට ඇතුලත් කළ යුතු බව | වා.දෙ. |
| කෙත් ඇල නියෝජිත - මහසෙන් බෙදුම් ඇල ගොවි සංවිධානය | වී දැමීම සඳහා භාවිත කරන මලු, කෘෂි නාශක බෝතල්, මත්පැන් බෝතල් වැනි දේ හේතුවෙන් පරිසරයට දැඩි විනාශයක් සිදුවන බවත් ඒ සඳහා යම් ක්‍රියාමාර්ගයක් ගැනීම සුදුසු බවත් | එම යෝජනාව ඉතා සුදුසු යෝජනාවක් බවත් මත්පැන් බී බෝතල් දමා යාම සම්බන්ධයෙන් මෙවන විට ක්‍රියාමාර්ග ගෙන ඇති බව | වා.දෙ. පො.දෙ. |
| ගරු සභාපති - මහසෙන් බෙදුම් ඇල ගොවි | ජල සම්පාදන මණ්ඩලය මගින් කැනීම් කටයුතු වලදී ගොවි සංවිධානයට අදාල ඩී- 7, එල් බී 03 කුඹුරු බට දෙකක් කැඩී විනාශ වී ඇති බව | එම බට දෙක හැකි ඉක්මනින් නැවත සකස් කර දීමට ජල සම්පාදන මණ්ඩලය දැනුවත් කිරීම | ජල ස.ම. ගො.සං. |

| | | | |
|---|---|---|---|
| ගරු සභාපති - කඩවලවැව බෙදුම් ඇල ගොවි සංවිධානය | පොහොර මුදල් එකතු කිරීමේ වැඩසටහන ජලය නිකුත් කිරීමට කලින් ක්‍රියාත්මක කිරීම සුදුසු ද යන්න | සුදුසු බව | ගො.සේ.කා. ගො.සං. |

2019.11.11 වන දින පැවති 2019/20 මහ කන්න රැස්වීමේදී දිස්ත්‍රික් ලේකම් ඇතුළු සියලු රාජ්‍ය නිළධාරීන් හා ගොවි සංවිධාන නියෝජිත මහතුන් හට ස්තුති ප්‍රකාශ කිරීම නේවාසික ව්‍යාපෘති කළමනාකාරතුමන් විසිනි සිදුකරන ලද අතර රැස්වීමේ කටයුතු ප.ව. 3.45 ට පමණ අවසන් කරන ලදි

පණ්ඩුක එස්.පි. අබේවර්ධන
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති
පොළොන්නරුව

පණ්ඩුක එස්. පී. අබේවර්ධන
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
පොළොන්නරුව

පිටපත්

1. ලේකම් : කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ඩිවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
2. අධ්‍යක්ෂ : වාරිමාර්ග කළමනාකරණ අංශය - කා.දැ.ස.
3. අධ්‍යක්ෂ : වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය - කා.දැ.ස.
4. දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ : පොළොන්නරුව - කා.දැ.ස.
5. ප්‍රාදේශීය ලේකම් : තමන්කඩුව/ හිඟුරක්ගොඩ - කා.දැ.ස.
6. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ : පොළොන්නරුව - කා.දැ.ස.
7. නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්: පොළොන්නරුව - කා.දැ.ස.
8. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්: අන්තර් පළාත් - කා.දැ.ස.
9. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ: බීජ හා රෝපණද්‍රව්‍ය - කා.දැ.ස.
10. ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්: පොළොන්නරුව - කා.දැ.ස.
11. වාරිමාර්ග ඉංජිනේරු : මින්නේරිය - කා.දැ.ස.
12. ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරි : ගිරිතලේ/ නවනගරය - කා.දැ.ස.
13. මූලස්ථාන කෘෂිකර්ම උපදේශක : ගිරිතලේ/ නවනගරය - කා.දැ.ස.
14. සභාපති: එකාබද්ධ ගොවි සංවිධානය - කා.දැ.ස.
15. කළමනාකරු : ලංකා බැංකුව/ මහජන බැංකුව - කා.දැ.ස.
16. සහකාර අධ්‍යක්ෂ: ජාතික පොහොර ලේකම් කාර්යාලය - කා.දැ.ස.
17. ප්‍රදේශීය කළමනාකරු: සී/ස තමන්කඩුව පොහොර සමාගම - කා.දැ.ස.
18. සහකාර අධ්‍යක්ෂ : කොමර්ෂල් පොහොර සමාගම - කා.දැ.ස
19. සහකාර අධ්‍යක්ෂ: කෘෂිකර්ම/ ගොවිජන රක්ෂණ මණ්ඩල - කා.දැ.ස.
20. පොලිස් ස්ථානාධිපති- මින්නේරිය/ කදුරුවෙල - කා.දැ.ස.
21. සියලුම ජනපද නිලධාරීන් - කා.දැ.ස.
22. සියලුම කෘෂිකර්ම උපදේශක මහත්ම මහත්මීන් - කා.දැ.ස.